1978 - 9 - 6

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 37 දරන ශ්‍රී ලංකා මැලේ සංගමයේ රුපියල් අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1978 අගෝස්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 30 යි තැපැල් ගාස්තුව: ශත 15 යි

## රුපියල් අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1978 අගෝස්තු මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 5/77.

**ශ්‍රී ලංකා මැලේ සංගමයේ රුපියල් අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකා මැලේ සංගමයේ රුපියල් අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජික යන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා සමතෙක් කොළඹ පිහිටුවා ඇති හෙයින් ද:

තවද, එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කර ගෙන ගොස් ඇති හෙයින් හා එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම පොදු යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 37 දරන ශ්‍රී ලංකා මැලේ සංගමයේ රුපියල් අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා මැලේ සංගමයේ රුපියල් අරමුදල සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වන දිනයෙහි හා ඉන් පසු. (මෙහි මින් මත "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මැලේ සංගමයේ රුපියල් අරමුදලේ සභාපති, උප සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සාමාජිකයන් වශයෙන් දැනට සිටින සියලු තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා මැලේ සංගමයේ රුපියල් අරමුදල" යන අභිධානය සහ නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා පවරනු ලැබීම කළ යුතු ද කළ හැකි ද වන්නේ ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද සිය කැමැත්ත පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වන්නේ ය:—

(අ) ශ්‍රී ලංකා මැලේ සංගමයේ සමාජ සේවා ශාඛාවේ වැඩ කටයුතු වල දී ඊට සහාය වීම;

(ආ) ආර්ථික සහ වෙනත් සහාය ලැබීමට සුදුසු තැනැත්තන්ට ඒ සහාය සලසා දීම;

ඒ 33453—9,970 (78/04)

(ඇ) ශිෂ්‍යත්ව ලැබීමට සුදුසු ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව පිරි නැමීම සහ ස්වකීය අධ්‍යයන කටයුතු කර ගෙන යාමට හැකි කිරීම පිණිස අවශ්‍ය යයි සලකනු ලබන සහාය වෙනත් කවර හෝ ආකාරයකින් සුදුසු ශිෂ්‍යයන්ට සලසා දීම;

(ඈ) අනාථ දරු නිවාස සහ මහලු තැනැත්තන් සහ අසරණයන් සඳහා නිවාස පිහිටුවා ඒවා නඩත්තු කිරීම; සහ

(ඉ) සමාජ ශුභ සාධන මධ්‍යස්ථාන පිහිටුවීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයෙහි නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් කිසිවක් හෝ වැඩිදියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයේ වූ හෝ සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

මහා කාරක සභාව.

5. (1) සංස්ථාවේ තත් කාලයේ වලංගුව පවතින රීති අනුව තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත මහා කාරක සභාවක් මගින්, සංස්ථාවේ තත් කාලයේ වලංගුව පවතින රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දින ධුර දරන අරමුදලේ මහා කාරක සභාව සංස්ථාවේ ප්‍රථම මහා කාරක සභාව වන්නේ ය.

භාරකාර මණ්ඩලය.

6. (1) නිල බලයෙන්, මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු සභාපතිගෙන්, ගරු ලේකම්ගෙන් සහ ගරු භාණ්ඩාගාරිකගෙන් ද, මහා කාරක සභාවේ සාමාජිකයන් නොවන්නා වූ සංස්ථාවේ සාමාජිකයන් අතුරින්, සංස්ථාවේ තත් කාලයේ වලංගුව පවතින රීති අනුව තෝරා පත් කර ගනු ලබන වෙනත් තැනැත්තන් හතර දෙනාගෙන් ද සමන්විත භාරකාර මණ්ඩලයක් විය යුතු ය.

(2) සංස්ථාව වෙනුවෙන් භාරකාර මණ්ඩලය විසින් සියලු මුදල් භාර ගැනීම ද චංචල හා නිශ්චල දේපළ දැරීම ද කළ යුතු ය. මහා කාරක සභාව විසින් නිර්දේශ කරනු ලබන පරිදි ඔවුන් විසින් මුදල් වියදම් කළ යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය මේ පනත ආරම්භ වීමේ දී නිල දරන අරමුදලේ භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම පිළිබඳව ද මහා කාරක සභාවේ, භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ නොයෙක් නිලධාරීන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම පිළිබඳව ද, රැස්වීම් කටයුතුවල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳව ද, සාමාන්‍යයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීම පිළිබඳව

ද සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී වැඩි ඡන්දයෙන් රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ රීති, සාදනු ලැබූ විට, එවැනි ම රැස්වීමක දී, (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව, වෙනස් කිරීම ද, ඒ රීතිවලට කිසිවක් එකතු කිරීම ද, ඒ රීති සංශෝධනය කිරීම ද, අවලංගු කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන සංස්ථාවේ මහා සභා රැස්වීමක දී, පැමිණ ඡන්දය දෙන තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් හැර සහ රීති වෙනස් කිරීම, ඒවාට කිසිවක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳව සාමාජිකයන්ට යටත් පිරිසෙයින් සති දෙකක දැන්වීමක් දෙනු ලැබීමෙන් පසුව මිස, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කර ගනු ලබන කිසිම රීතියක් හෝ වෙනස් කිරීම හෝ ඒවාට කිසිවක් එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දින බල පවත්වන අරමුදලේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයෝ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් වන්නාහ.

අරමුදලෙන් අය විය යුතු සහ අරමුදලට ගෙවිය යුතු ණය.

8. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී පවතින අරමුදලේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර අරමුදලට අය විය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සියලු සහභාග මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. සභාපති සහ ගරු ලේකම් හෝ ගරු භාණ්ඩාගාරික ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඔවුන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බෑහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙහි ලා

සංස්ථාවට හැකි විය යුතු අතර ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත් කාලීන රීති වලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් තබා ගත යුතු ය.

ජනරජයේ
ගෙ
නායයන්ගේ
අයිතිවාසිකම්
ආරක්ෂා
කිරීම.

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.